

මායා දේවියගේ සිහිනය

මිග ජාතකය

# භාරුත් බෞද්ධ කලා නිර්මාණ

## ඎ සසර දිගු කර ගන්නෝ

– කුරුණෑගොඩ පියතිස්ස නාහිමි

පුද්ගල සන්තානය තුළ විමුක්ති මගට බාධා කරන ආශ්‍රව ධර්ම වැඩි–මට හේතුවන දහම නොදත් – පුහුදුන් පුද්ගලයන් තුළ පවතින දුබ–ලතාවක් පිළිබඳ බුද්ධ දේශනාවකට අර්ථ විවරණයක්, ඉල් අමාවක පෝදා ධර්ම දේශනාවෙන්.

## ඎ නොමග ගිය පයක හැඩ

– මැණික්හින්නේ ධම්මදින්න හිමි

දහම තුළ විස්තර කැරෙන සත් පුරුෂ ගුණ දහම් නොමැති; විමුක්ති මග නුදුටු අසත්පුරුෂයාගේ ස්වභාවය විග්‍රහ කැරෙන බුද්ධ දේශනා–වකට අර්ථ විවරණයකි.

## ඎ නායකත්වය ගොනගන බෞද්ධ සාරධර්ම

– ආචාර්ය එස්. අයි. ගමගේ

බෞද්ධ සාරධර්ම මගින් නායකත්වයට අවශ්‍ය පෞරුෂය ගොඩනැංවීම සඳහා ලැබෙන අනුබලය මෙම ලිපියෙන් විග්‍රහ කැරේ.

## ඎ 'ආත්මයක්' නැතිව සිදුවන සසර ගමන

– මහගල්වැවේ බුද්ධසිරි හිමි

බුදු දහමට අනුව සසර ගමන් කරන; 'ආත්ම' නමින් බුද්ධකාලීන වෙනත් ඇතැම් ශාස්තෘවරුන් විසින් හඳුන්වන ලද කිසියම් ස්ථිරසාර වූ බලවේගයක් පුද්ගලයා සතුව නොමැති බවත්, හේතු – ඵල වශයෙන් විවිධ බලපෑම් යටතේ ඉදිරියට ඇදෙමින් පවතින අස්ථිර චිත්ත ශක්ති සමූහයක් විසින් පුද්ගලයාගේ සසර පැවැත්ම සිදු කරන ආකාරයත්, මෙම ලිපියෙන් විමසුමට ලක් වී ඇත.

## ඎ දහම් එළියෙන් විවර වූ දියුණුවේ මං පෙත

– නිශාන්ත පීරිස්

බුදු දහම හුදෙක් ලෝකෝත්තර සැපත ගැන පමණක් අවධානය යොමු නොකළ දහමක් බවත්, එයින් ලබන ජීවිත අවබෝධයේ අතුරු ඵලයක් හැටියට මිනිසාගේ සමාජ ජීවිතය විධිමත් වන ආකාරයත්, ඒ සඳහා සරල ලෙස ඉදිරිපත් වී ඇති උපදෙස් පිළිබඳවත් මෙම ලිපියේ කරුණු ඉදිරිපත් කොට ඇත.

## ඎ බෞද්ධ මූලධර්ම හෙළි කරන අධ්‍යාපන උපාය මාර්ග

– රෙජී වීරමන්

අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ නව උපාය මාර්ග වශයෙන් භාවිතා කළ හැකි බෞද්ධ දර්ශනික මූලධර්ම පිළිබඳ මනෝ විද්‍යාත්මක වශයෙන් ඉදිරිපත් වන විග්‍රහයක – දෙවැනි කොටස. මෙහි මුල් කොටස පසු–ගිය පත්‍රයේ පළ විය.

## ඎ දහමට අනුව ලද යුතු නිදි සුව

– රොබට් ප්‍රේමදාස උඩුනුවර

දහමෙහි දැක්වෙන මනස සුවපත් කරවන සුළු පිළිවෙත් කිහිපයක් විග්‍රහ කර, ඒවා එදිනෙදා ජීවිතයේ දී නිදි සුව ලැබීම සඳහා යොදා ගත හැකි ආකාරය යෝජනා කැරෙන ලිපියකි.

## ඎ හිරු සඳු වන් මවු පියවරු හඬවන්නේ ඇයි දරුවනි

– මක්කානිගොඩ අස්සජී හිමි

මවුපිය දූ – දරු සබඳතා විධිමත් විය යුතු ආකාරය පැහැදිලි කිරීමට දරන උත්සාහයකි. විශේෂයෙන් දූ දරුවන් විසින් මවුපියනට සැලකිය යුතු ආකාරය පිළිබඳ මෙම ලිපියෙහි දීර්ඝ වශයෙන් සාකච්ඡා කැරේ.

## ⁜ ඔබ හොඳ සැමියෙක් ද?

– ආචාර්ය සිරිපාල මාදුවගේ
පවුල් සංස්ථාව විධිමත් වීම සඳහා බුදු දහමෙන් ලැබී ඇති මග පෙන්වීම. වර්තමාන යුගයේ බොහෝ සමාජ ගැටලු නිර්මාණය වීමට හේතු වී ඇති ස්වාමි – භාර්යා සබඳතා නිරවුල් වීම සඳහා ස්වාමියකු අතින් ඉටුවිය යුතු යුතුකම් හා පිළිවෙත් සමූහය – මෙම ලිපියෙන් විමසුමට ලක් කැරේ.

## ⁜ ශ්‍රී ලංකා – තායිලන්ත බෞද්ධ සබඳතා

'සයුරෙන් එහා' විශේෂාංගය යටතේ ශ්‍රී ලංකාවත් – තායිලන්තයත් අතර ශාසනික වශයෙන් පැවැත්වෙන සබඳතා පිළිබඳ විමසුමකි.

## ⁜ The doctrine of Karma and survival

*- By Thera Piyadassi*

## ⁜ මිනුවන්ගොඩ කලවාන හස්තිවනාරාමය

– බී. ඩබ්ලිව්. චන්ද්‍රසේකර
ගම්පහ දිස්ත්‍රික්කයේ උතුරු අලුත්කුරු කෝරළයේ මිනුවන්ගොඩ මැතිවරණ කොට්ඨාසයේ පිහිටි පැරැණි විහාරස්ථානයක් පිළිබඳ තොරතුරු.

## ⁜ ඉසිවර රජදහනේ රූසිගල කඳු මුදුනේ සුන්දර වන අරණේ රැඳි මොහොතක වරුණේ

– කපිල කුලසිංහ
කළුතර දිස්ත්‍රික්කයේ අවසන් කොටසට මායිම් වෙමින්; සිංහරාජ වන පියසට යාබදව පිහිටා ඇති සුන්දර වන සෙනසුනක තොරතුරු. බදුරලිය – රත්නපුර මාර්ගයේ ගොස් අත්වැල්තොට නගරයෙන් හැරී දිගන්න පාරේ සැතපුම් පහක් පමණ තුරු ලතා පිරි වනයක් තුළ දුෂ්කර මගක් ගෙවා මෙම සේනාසනයට ළඟා විය හැකිය.